# සීතා, කාලිබිරාඬි, පත්තිනි, ගිරි අම්මා හා වෙනත් ඇදහීම්



මහින්දාගමනයෙන් පසුව වළගම්බා අවධිය වන විට සීතාවක පෙදෙස් බෞද්ධ වටා පිටාවක් පැවතිණි. එහෙත් ඈත අතීතයේ සිටම වෙනත් ඇදහිලි හා විශ්වාසද පැවතුණු බවට ශාක්ෂි ඇත. සීතාවක පත්තිනියකි. වසර දොළහක් ලංකාවේ සිටි ඇය රාවණායන්ට අවනත නොවූවාය. පති දහම ශක්ති වන්දනාවේ වැදගත් ලක්‍ෂණයකි. සීතාවක වටා මැදගෙ ාඩ, කබුලු මුල්ල, නවගමු, කඩුවෙල ආදී ස්ථ ානවල පත්තිනි දේවාල පවතී. ගජබා සමයේ සිට ලංකාවේ (විශේෂයෙන් සීතාවක අවට) පත්තිනි ඇදහීම ප්‍රචලිත වී ගිය බව පෙනේ. ගජබා රජුගේ නිල යෝධයා සීතාවකට නුදුරු මාගම්මන ගමේ විසූ බව ජනප්‍රවාදයේ එයි.

ජගත්මාතා පිදීම ලෝකයේ නොයෙක් රටවල නොයෙක් ලෙසින් පැවතිණි. මොහෙන්ද්‍රෝජාරෝ ශිෂ්ටාචාරයේ පවා මෙය පැවතිණි. ලංකාවේද එක් එක් අවධිවල විවිධ ස්වරූපයෙන් ප්‍රචලිතව පැවති අන්දම පෙනේ. රාම සීතා කථාව එක් අවස්ථාවකි. සීතා නදිය අසබඩ බිරාඬි දෙවොල ආදියේ සිටම කාලි බිරාඬි (කාලි යක්‍ෂණිය) හා සම්බන්ධ වූවා විය හැකිය. කාලි බිරාඬි (හෙරණ්ඩි) ගේ ආරම්භය බෞද්ධ කථාවකි. ධම්ම පදටථ කථාවේත්, සද්ධර්ම රත්නාවලියේත් කාලි යක්‍ෂණියගේ උපත විස්තර වේ: (කාලි බිරාඬි ලක්දිවට ගෙන ආවේ අරිට්ට කී වෙණ්ඩු නොවේ.)

විවාහ වූ කුල පුත්‍රයෙක් තම බිරියට දරුවන් නොවූ බැවින් බිරියගේම කැමැත්ත උඩ වෙනත් විවාහයක් කරගති.දෙවන බිරියගේ කුස පිළිසිද ගත් දරුගැබ දෙවාරයකදීම පළමු බිරිය විනාශ කර දැමුවාය. තෙවන වාරයේදී දරුවා පමණක් නොව මවද විනාශ වන පරිදි ඇය කටයුතු කළේ සපත්ති රෝෂය නිසාය. වෛර සිතින් මිය ගිය මව ඊළඟ ආත්ම භාවයේදී අනික් එකියගේ දරුවන් කෑවාය. මෙසේ භවයෙන් භවයට වැඩී ආ වෛරය නොසන්සිඳී විත් බුද්ධ කාලයේදී එකියක් යක්‍ෂණියක්ව උපන්නාය. අනික් අය කුලගෙයක ඉපිද වැඩී දීගයක ගියාය. යක්‍ෂණිය දෙවරක්ම මැයගේ දරුවන් කෑවාය. තුන්වන අවස්ථාවේදී ඇය දරුවා රැක ගැනීමට දෙමාපියන් වෙත ගියාය. දරුවා ගොඩ තබා ළිඳකින් නාමින් සිටින් විට යක්‍ෂණිය ඈත එනු දුටුවාය. දරුවා රැගෙන දිවූ ඇය බුදුන් හමුවට ගොස් පිහිට පැතුවාය. බුදු බණ අසා යක්‍ෂණියගේ වෛරය සන්සිඳුනි. ප්‍රාණඝාතයෙන් වැළකුණු ඇයට බුදුන්වහන්සේ ගේ උපදෙස් පරිදි අනික් කාන්තාවගේ රැකවරණය ලැබිණි. යක්‍ෂණිය ගස් බෙනයක ඉන්නට සලස්වා ආහාරයෙන් පුදන විට යක්‍ෂණියද ප්‍රති උපකාර වශයෙන් ඔවුන්ගේ ශෂ්‍ය වර්ධනයට උපදෙස් දුන්නාය. වසංගත රෝග ආදියෙන් ආරක්‍ෂා කළාය. මේ පුවත ඇසූ ගමේ අනෙක් අයද යක්‍ෂණියට සලකන්නට වූහ. ඒ අනුව කාලි යක්‍ෂණිය ගමටම ආශිර්වාදයක් වූවාය. ශෂ්‍ය වර්ධනය සඳහාත් වසංගත වලින් මිදීමටත් දරුවන්ගේ ආරාක්‍ෂාව පිණිසත් කාලිය පුදනු ලැබේ. මෙම ඇදහීම අටුවා කාලය (ක්‍රි.ව. 5 සියවස) දක්වාත් කාලි බිරාඬි නමින් ශ්‍රී ලංකාවේ පැවති බව සද්ධර්ම රත්නාවලිය කියයි.

"උඹ හැම ඒ අසා හැයි අප නිරන්තරව කැඳ බත් හැරගෙන් යමින් පිටත යන නියාව නොදතුද ? අපත් ඒ ගෙන යන්නේ එක් යකින්නනි කෙනෙකුන්ටය. උඹ වැසි ඇති නැති අවධිය කියාලති. උන් නිසා අප කළ දෙයක් නොවරද්දී තෙපි හැමත් අප කරන ලෙසම කරවු නම් තොපටත් අමුතු මුසුප්පුවක් නැතිහෙයින් එසේම කියතියි කීහ. නුවරු ඇත්තෝ මුළුල්ලත් එලෙසම සත්කාර කොට උන්ගේ සමවායෙන් ගොයමින් බතින් අඩුවක් නැති වූහ. උසින් මහත් වූ ලා හසත්කාර ඇතිවැ කාලි බිරාඬියැයි ප්‍රසිද්ධව ලාබත් අටකුත් තබාලූය. ඒ ලාබත් අටුවා කරන කල් පැවැත්තේය."

"සද්ධර්ම රත්නාවලිය"

මෙසේ කාලි බිරාඬිය පිදීම ජගත් මාතා පිදීමේ බෞද්ධ මුහුණු වරයි. හෙරණ්ඩි, හෙරව්, බිරාඬි කාලි යක්‍ෂණියම වේ. සීතාවක හෙරණ්ඩි දෙවොල ඈත කාලයේ සිටම සීතාව උදෙසා හෝ වේවා කාලියක්‍ෂණිය උදෙසා හෝ වේවා මුල්වූ තැනක් බව සිතා ගත හැකිය. කාලිය දේවත්වයෙන් සිටින විට සීතා, පත්තිනි උමා යන නම් වලින්ද, භීෂණ ස්වරූපයෙන් සිටින විට දුර්ගා ශ්‍යාමා, කාලි, හෙරවී චාමුණ්ඩි, මෝහිනී ආදී නම් වලින් ද හැඳින්වේ. යකැදුරන්ගේ ආරක්‍ෂක මන්ත්‍රයක් වූ නව කුෂ්ඨරාජයේද ඇය වෙනුවෙන් "කාලි, මහා කාලි ශිව රූපී, විශ්ව රූපී, භූවන, රාක්‍ෂි, භූවනේ ස්වරී, බාලගිරි, බාලදේවී, සිද්ධියෝගි, චාමුණ්ඩී, ගණේස්වරී, ඉන්ද්‍රනීල, දේවි මාතාංග නී, නීල රාක්‍ෂි, කාල රාක්‍ෂී, සරස්වතී, මිහිපතී, උමාපතී, පාර්වතී, පණ්ඩාණ්ඩ දේවී, ආකාශ දේවී, පානාල දේවී, මහා මොහනි ආදී නම් භාවිතා වේ. මේ හැර එම මංත්‍රයේම මහා හෙරවී, දේව හෙරවී, අචච හෙරවී, ඉමාන් හෙරවී, කාල හෙරවී, අකාල හෙරවී, ඝෙර හෙරවී, යන නමින් ද ඇතුළත් වේ. මේ නම් ඇතුලත්වන සියළුම ජන කථා මාතෘ දෙවඟන පිළිබඳ වූ එකම ඇදහිල්ලක විවිධ ස්වරූප විවිධ අවස්ථා සේ සැලකිය හැකිය. රාම සීතා රාවණා කථාවත්; කාලි යක්‍ෂණී; අපදානයත්; පත්තිනි පාලහ ඇදහීමත්; (කොවාලන් = ගෝපාලන්, ක්‍රිෂ්ණා = කණ්නගි (ජානකී) මාදේවී = (මාධවී) ප්‍රවෘත්තියත්, එකම ඇදහිල්ලක විවිධ ස්වරූපයන්ය. එසේම විෂ්ණු + ලක්‍ෂමි, බ්‍රහ්ම + සරස්වතී, උපුල්වන් + ගෞරී, හර + උමා, යුගලයන්ද පතිදමට මුල්තැන දෙන ඇදහිලි වේ.

ශෂ්‍ය වර්ධනය සඳහාත් වසංගත රෝග වලින් මිදීමටත්, දරුවන්ගේ ආරක්‍ෂාව උදෙසාත් කිරි අම්මාලාට දන්දීමට ලක්දීව හැම පෙදෙසකම කෙරේ. එදා බුද්ධ කාලයේදී කාලි යක්‍ෂණියට බිලි පිදූ ලෙසටම අදත් මේ සිරිත පවතී. කිරි අම්මා යනු ගිරි අම්මාය. ඇය පාර්වතියයි. ගිරි දේවියයි. තල්දූවේ පිහිටි කිරි අම්මලා කන්ද මේ ඇදහීමට සම්බන්ධ විය හැකිය. කිරි අම්මලා පිදීමේදී පත්තිනි දේවියට මුල් තැන දෙනු ලැබේ. හලාවතට නුදුරු මුන්නේස්වරම් දෙවොල ද පත්තිනි, පාර්වතී, කාලි, දෙවොලකි. මාදම්පේ තනිය වල්ලභ රජු කල සීතාවක වාසලින් මුන්නේස්වරමට ඇතුන්, සඳුන් ඇතුළු පිසවිලි නියම වී තුබුණු බවට එම දෙවොල් ලියවිලි වල සඳහන් බව කියැවේ. මෙම දෙවොලද සීතාවක සමයට වඩා පැරණි එකකි.

ලිහිල් වූ වස්ත්‍රය හැද ගන්නා තුරු දරුවකු වඩාගන්නට දෙන කාන්තා අවතාරයක් ගැනද විශ්වාසයක් ඇත. මේ මෝහිනිය කාලියක්‍ෂණියම නොවේද; කාලි යක්‍ෂණී කථ ාවට සමාන ජන කථාවක් සීතාවකට නුදුරු ගැටහැත්ත සම්බන්ධ කර ගෙන් ගොඩ නැගී ඇත. එක් යකැදුරෙක් යක්‍ෂණියක බන්ධනයකට අසුකරගෙන සිටියේය. ඔහු ගෙදර නොසිටි අවස්ථාවක යක්‍ෂණිය ඇදුරු බිරිය රවටා ඉසේ ගසා තුබුණු කටුව ගලවාගෙන බන්ධනයෙන් මිදී ඇදුරු බිරියද මරා දරුවාද කා ඇදුරා වෙත ගියාය. ඇදුරා ඇය පසු පස ලුහුබැඳ ගැටහැත්තෑවක් ගැසූ තැන ගැටහැත්තේදී අල්ලා ගති. ඇදුරු බිරියත් යක්‍ෂණියත් කාලි යක්‍ෂණී කථාවේ සපත්තීන්ට සමාන ය.

සීතාවක නුදුරු උස් කඳු මුදුන යකහටුවයි. (යක + ඇහැටුව) සැදෑ කල කඳු මුදුන්වල පවතින වන ඉරුරැස් රාස්සිගේ අව්ව හැටියට ගැමියෝ අදහති. රාස්සිය මේ අව්වෙන් වී පැදුරු හතක් වේලා ගන්නේලු. ගිරිදේවිය (පාර්වති) හා ශෂ්‍ය පිළිබඳ සබඳකම එයින් හෙළිවේ. කාලිය කඳු මුදුන් වලට අරක්ගත් විට ගිරි දේවියයි. කාලිය, ගිරිදේවිය, බිරාඬි, පත්තිනි, සීතා ඇදහීම ඈත අතීතයේ සිටම පැවති බවත් බිරාඬි දෙවොල සීතාවක සමයට වඩා පැරණි විය හැකි බවත් මේ කරුණු වලින් සනාථ වේ. මේ පිළිබඳ තවත් තොරතුරු ගෘහ නිර්මාණය පිළිබඳ පරිච්ඡේදයේ විස්තර වනු ඇත. පියාගේ මරණය පිළිබඳ චෝදනාව මත කලකිරීමකින් පසු වූ රාජසිංහ රජුට භික්‍ෂූන් වහන්සේ ගෙන් පිළිසරණක් නොලද විට අවස්ථ ාවාදී අරිට්ට කී වෙණ්ඩු ඊට ඉදිරිපත් වූයෙන් බිරාඬි දෙවොල් පාලනය ඔහුට ලැබුනා විනා එහි නිර්මාපකයා ඔහු නොවනු ඇත.

සිව්වන පැරකුම් රජු කල (14 සියවස මුලදී) මායා දුනු පුරයේ පිහිටවූ උපුල්වන් දෙවොලක් ගැනද සිංහල මහා වංශයේ සඳහන් වේ.

"ඉක්බිති ඒ නරාධිපති තෙමේ මායාදුන්නේ නම් චිත්තාකර්ෂණය කරන සුළුවූ රාෂ්ට්‍රයෙහි යහපත් ප්‍රාකාර දවාර කෝෂ්ට ඇති. අභිනව නගරයක් නිමවා එහි පවුරු ගෝපුර දොරටුයෙන් යුක්තව උස් සිඟුයෙන් හෙබියා වූ දිව් භූමක දේවාලයක් කොට නිමවා එහි උත්පල වණ්ණා දිව්‍ය රාජයාගේ භාස්වර වූ රූපය පිහිටුවා මහා පූජාද පැවැත්වූයේය."

(සිං. මහා වංශය 409)

මෙහි සඳහන් මහාදුන්නේ පුරය සීතාවකම බව ආචාර්ය පුංචි බණ්ඩාර සන්නස්ගලයෝද පිළිගනිති. එසේ නම් මේ දිව් භූමක උපුල්වන් දේවාලය කොතනකද? පැරණි සීතා, පත්තිනි, කාලි දෙවොල් බිමේම මෙය ඉදිවන්නට ඇත. පාෂාණමය ගොඩ නැගිල්ලක් ඉදිකොට උපුල්වන් දෙව් රුවක්ද තැබූවා විය හැකියි. ආඬි ගුරුන්ගේ බලවට යටත් වූ පසු මෙම වෛශ්නව + ගෞරී දේවාලය ශිව + උමා දෙවොලක් බවට පත්වන්නට ඇත. මෙය බටහිරට මුහුණලා තිබීම විශේෂයෙන් වරුණ හා සම්බන්ධ කළ හැකි ශාක්‍ෂියකි. මෙම බිම අදත් මහ නුවර විශ්ණු දේවාලයට අයත් වීම තවත් සාධකයෙකි.

සීතාවක යුගයටත් පෙර සිටම දකුණු ඉන්දියාවෙන් තවුස් වෙස් ගෙන මෙහි සංක්‍රමණය වූ සන්‍යාසීන් නිසා උමා වැනි දේව ඇදහිලි වලට අමතරව යන්ත්‍ර මංත්‍ර විධි, හදි හූනියම්, ඇස්වහ, කටවහ, හෝවහ ආදිය පිළිබඳ අදහස් බෙහෙවින් ප්‍රචලිත වන්නට ඇත. මිනිසාට සම්පත් දෙන්නේ දෙවියන්ය. (දේවෝදානාත්) ව්‍යසන පමුනුවන්නේ යකුන්ය. ග්‍රහයෝ ඒ දෙකම කරති. ග්‍රහ අපල දුරු කිරීම සඳහා ජ්‍යොතිශය දත් ඇදුරන් ලවා කේනදරය පරීක්‍ෂා කරවා බලියාග කෙරේ. කෝට්ටේ අවදියේ විසූ ශ්‍රී රාහුල හිමි ජොතිශය දැනීම අතින් ඉහළ මට්ටමක සිටි කෙනෙකි. බමුණන් පවා තොටගමුව විජයබා පිරිවෙනෙහි අධ්‍යාපනය ලද බව ගිරි සන්දේශය කියයි.

තියුණු නැණින් කෙරෙමින් සැක නිවාර ණ
පමුණු වමින් එකිනෙක සමය කාර ණ
දැපුණු සිතින් ඉද කැර වෙහෙර පුර ණ
බමුණු රැසෙක වෙදරුත් කෙරෙන දාර ණ

බලියාග තොවිල් ආදිය බෞද්ධ මුහුණු වරකින් කිරීමට තොටගමුවේ හිමිත් වීදාගම හිමිත් උපදෙස් දුන්හ. අසුගැබ, දියකොරහ, මහ නිපඟරාස්සය, දශාක්‍රෝධය විස්කම් බලිය සෙනසුරු ඒරාශ්ටකය ආදී බලියාග පවත්වා අවසන අඝොර නවනාථ, සංජීවනී, මෝර්තුංජය වැනි යන්ත්‍ර පැලදීම මෑතක් වන තුරුම මේ සමාජයේ මුල් බැස ගෙන තුබුණි. ජෝතියරත්න ගණිත දොඩම්පේ ගණිත ආදීහු එදා රජුත් ඇසුරු කළ නකත් දතුවෝය. මේ යන්ත්‍ර විධි කෙරෙහි මහායාන බලපෑමද ඇතිසේ පෙනේ. වාණිජ සමාජ ක්‍රමය මගින් පැරණි ග්‍රාමීය සමාජ ක්‍රමයේ ජීවන සුවඳ මැකී යමින් පවතී. මිනිසුනට අපල කළ යකුන් අතර රීරී යකා (ලේ) මහ සොහොනා (සෙම) හා කළුයකා (වාතය) මුල්තැන ගනී. ඔවුන් සතුටු කර සෙත සැලසීම සඳහා තොවිල් කෙරිණි. දෙවියන් සතුටු කිරීමට ගම්මඩු, දෙවොල් මඩු, දානෙ මඩු, පහන් මඩු, පූනා මඩු ආදිය නැටූහ. කිහිරැලි, උපුල්වන්, සමන්, බොක්සැල්, විභීෂණ කන්ද කුමාර ශ්‍රී ලංකාව භාර ප්‍රධාන දෙවිවරුන්ය. ගම්භාර සූනියම් දේවාතාවාන් ප්‍රදේශයේ තවමත් පිදෙන දෙවියෙකි. නවගමුව වැනි හැම දෙවොල් බිමක්ම වාගේ එකම දෙවියකු සඳහා පමණක්

සීතාවක යුගයටත් පෙර සිටම දකුණු ඉන්දියාවෙන් තවුස් වෙස් ගෙන මෙහි සංක්‍රමණය වූ සන්‍යාසීන් නිසා උමා වැනි දේව ඇදහිලි වලට අමතරව යන්ත්‍ර මංත්‍ර විධි, හදි හූනියම්, ඇස්වහ, කටවහ, හෝවහ ආදිය පිළිබඳ අදහස් බෙහෙවින් ප්‍රචලිත වන්නට ඇත. මිනිසාට සම්පත් දෙන්නේ දෙවියන්ය. (දේවෝදානාත්) ව්‍යසන පමුනුවන්නේ යකුන්ය. ග්‍රහයෝ ඒ දෙකම කරති. ග්‍රහ අපල දුරු කිරීම සඳහා ජ්‍යොතිශය දත් ඇදුරන් ලවා කේනදරය පරීක්‍ෂා කරවා බලියාග කෙරේ.

33 වන පිටුවට



ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි

